# විදේශ කටයුතු අමාත්‍ය ගරු මංගල සමරවීර මැතිතුමා 2016 ඔක්තෝම්බර් 07 වැනි සිකුරාදා සාර්ක් සංවිධානය පිළිබඳව පාර්ලිමේන්තුවේ කළ ප්‍රකාශය.

ගරු කථානායකතුමනි,

2016 නොවැම්බර් මස 09 හා 10 දිනවලදී ඉස්ලාමාබාද් හි පැවැත්වීමට නියමිතව තිබූ 19 වැනි සාර්ක් සමුළුව පිළිබඳව සහ දකුණු ආසියාවේ කලාපීය සහයෝගීතාව හා සම්බන්ධ කරුණු පිළිබඳව ප්‍රකාශයක් කිරීමට මම නැගී සිටිමි.

ගරු කථානායකතුමනි,

මෙම සභාව දන්නා පරිදි ශ්‍රී ලංකාව සාමාන්‍යයෙන් සාර්ක් ලෙස හඳුන්වනු ලබන දකුණු ආසියානු කලාපීය සහයෝගීතා සංගමයේ ආරම්භක සාමාජිකයෙකි. ඇත්ත වශයෙන්ම ප්‍රථම වරට කලාපීය සහයෝගීතා සංකල්පය පිළිබඳ සාකච්ඡා කරන අවස්ථාවේ ඊට සහය ලබාදුන් රටවල් අතර ශ්‍රී ලංකාවද වේ. එහෙයින් දකුණු ආසියානු කලාපීය සහයෝගීතා සංගමය සංකල්පනය කරන ලද අවස්ථාවේදී ශ්‍රී ලංකාව ඉබේම 1985 නොවැම්බර් 08 වන දින සාර්ක් ප්‍රඥප්තියට මුලින්ම අත්සන් තැබූ රටක් බවට පත් විය. 1985 සිට දශක තුනක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ බලයට පැමිණි අනුයාත ආණ්ඩු සාර්ක් සංවිධානය හරහා කලාපීය සහයෝගීතාව සඳහා විශ්වාසවන්තව කටයුතු කොට තිබේ. 1985 දෙසැම්බර් 07 වන දින ඩකාහිදී පවත්වන ලද පළමු සමුළුවේදී ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා විසින් ප්‍රකාශ කළ වදන් කිහිපයක් මගේ මතකයට නැගේ. " අපගේ දුෂ්කර කාර්යන් තුළින් උසස්ම ප්‍රතිඵල සළසා ගත හැකි යැයි ද එමගින් පොදු ජනතාවට හා අප රටවලට ඉමහත් සුභ සිද්ධියක් සලසා ගත හැකි යැයි ද අප විශ්වාස කරන හෙයින් ද විශ්වාසයෙන් හා සුභවාදීව අපි අපේ කාර්යන්ට ප්‍රවිශ්ඨ වෙමු"

කලාපීය සහයෝගීතාව සම්බන්ධයෙන්ද අප තුළ ඇති තිරසාර බැඳීම් ගැන සඳහන් කරහොත් තෙවරක්ම එනම් 1991, 1998 සහ 2008 සාර්ක් සංවිධානයේ සභාපතීත්වය දරමින් නායකත්වය ලබා දීමට ශ්‍රී ලංකාව ඉදිරිපත් විය. සාර්ක් ප්‍රඥප්තියේ සඳහන් පරමාර්ථ එනම් " දකුණු ආසියාවේ ජනතාවගේ සුභ සාධනය ප්‍රවර්ධනය කිරීමට කලාපයේ ආර්ථික වර්ධන වේගය කඩිනම් කිරීමට, සමාජ ප්‍රගතිය උදා කිරීම හා සංස්කෘතික සංවර්ධනය ඇති කිරීමට ඉදිරිපත්වී සාර්ක් සංවිධානයේ ක්‍රියාශීලී පාර්ශවකරුවන් වූයෙමු."

සාර්ක් සංවිධානය ආරම්භ වූ තැන් පටන් කලාපයේ සෙසු රටවල් සමග සහයෝගයෙන් කටයුතු කරමින් සාර්ක් කලාපයේ රටවල ජනතාවගේ ජීවන තත්වය නගා සිටුවීම සඳහා සාර්ක් සංවිධානය කලාපයේ ජනතාවට උචිත වන්නා වූද ප්‍රයෝජනවත් වන්නා වූද සංවිධානයක් බවත් එක්ව කටයුතු කිරීමේ වටිනාකම් හුවා දක්වන්නාවූ සංවිධානයක් බවත් කලාපීය සහයෝගීතාව තමන්ගේ ජන ජීවිත යහපත් බවට පත් කර ගැනීමේ මාර්ගයක් බවත් ඔවුන්ට ඒත්තු ගැන්වීම සඳහා හැකි සෑම පියවරක් අපි විසින් ගෙන ඇතැයි විශ්වාස කරන අතර ඒ සම්බන්ධයෙන් අපි ආඩම්බර වෙමු.

නිදහස් ආර්ථික ක්‍රමය ප්‍රවර්ධනය කිරීමේ සිට භෞතික සම්බන්ධතාව සහ වෙළඳාම දියුණු කිරීම, මිනිසුන් අතර සම්බන්ධතා හා සංස්කෘතික සහයෝගිතා වැඩි දියුණු කිරීම, අන්‍යෝන්‍ය සම්ප්‍රදායයන්, පරිචයන්, සාහිත්‍ය ශිෂ්ටත්වය යනාදිය හඳුනාගැනීම, සාර්ක් සන්නාමය, පාලනය, සුරක්ෂාව, කෘෂිකර්මාන්තය සහ වෙනත් අංශ ගණනාවක ප්‍රවර්ධනය උදෙසා කලාපයේ සෙසු රටවල් සමග එක්ව කටයුතු කරමින් සිතිය හැකි සෑම ආකාරයකම සහයෝගය ලබා දීමෙන් ශ්‍රී ලංකාව කටයුතු කළේය.

කලාපයේ සියලුම සංවර්ධන උපක්‍රම කෙරෙහි බලපාන බලශක්තිය ආරක්ෂා කිරීම, ආහාර සුරක්ෂිතතාව සහ කාලගුණික විපර්යාස වැනි ගෝලීය ගැටලු සම්බන්ධයෙන් කටයුතු කිරීමේ හැකියාව ගැන විමසිලිමත් විය යුතුය යන සංකල්පය කෙරෙහිද ශ්‍රී ලංකාව අනුබල දුන්නාය. කලාපයක් වශයෙන් අප රට වලට පොදුවේ බලපාන ප්‍රශ්න සාකච්ඡා කොට පොදු තීරණවලට එළඹීම සඳහා සාර්ක් සංවිධානය මගින් වේදිකාවක් සකස් වේ.

අප රටේ දේශපාලන පක්ෂ සන්ධාන ක්‍රමයක් වුවද, ශ්‍රී ලංකාවේ සාමූහික දැක්ම වනුයේ දකුණු ආසියාවේ සියලුම ජනතාවට ප්‍රතිලාභ අත් කරදෙන සර්වග්‍රාහි සහ සාමූහික, සීඝ්‍රයෙන් සංවර්ධනයවන කලාපයක් ගොඩනැගීම සඳහාවන දැක්මක්වන අතර එය සාර්ක් සංවිධානයේ ප්‍රඥප්තියේ දැක්ම යථාර්තයක් බවට පත් කරමින් මෙම කලාපයේ ජනතාව කෙරෙහි යහපත් බලපෑමක් එල්ලකරන කාර්යක්ෂම හා ඵලදායි

යාන්ත්‍රණයක්වන දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංගමයක් වූ රටවල් අතර පුද්ගලයින් සේම අදහස් නිදහසේ හුවමාරුවන සාමය, මිත්‍රත්වය හා සෞභාග්‍ය රජයන සමෘද්ධිමත් දකුණු ආසියාවක්.

ගරු කථානායකතුමනි,

1985 දී ප්‍රථම සාර්ක් සමුළුව අමතමින් ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා මෙසේ පැවසීය. "අප එකිනෙකා මනාව අවබෝධ කරගන්නා තරමටම අපේ අරමුණු ඉටු කර ගැනීමේ කටයුතුද පහසු වේ. පොදු අවබෝධයෙන් හා අන්‍යෝන්‍ය විශ්වාසයෙන් තොරව කලාපීය සහයෝගීතාව සාර්ථක කරගත හැකි නොහැකිය."

ගරු කථානායකතුමනි,

කලාපයේ සෞභාග්‍ය හා අර්ථවත් සහයෝගීතාව පිළිබඳ අපේ දැක්ම සපුරා ගැනීම උදෙසා සාමය හා සුරක්ෂාව මූලික අවශ්‍යතා වන්නේ යැයි යන මතය ප්‍රතික්ෂේප කළ නොහැකිය. මැඩපැවැත්විය නොහැකි ද්වීපාර්ශ්වික ගැටලු නොවිසඳී පවතින තාක් කල් කලාපීය සහයෝගීතාවයේ ප්‍රශස්ත තත්වයට එළඹිය නොහැකි වේ යැයි යන මතයද ප්‍රතික්ෂේප කළ නොහැකිය.

ත්‍රස්තවාදය යනු අප කලාපය බෙදී වෙන්වී මුහුණ දිය යුතු ගැටලුවක් නොව, එකට එක්වී තුරන් කළ යුත්තකි. එය අප සෑම රටකටම පාහේ ආර්ථික හා සමාජීය වශයෙන් දැඩි බලපෑම් එල්ල කරන ලද උවදුරකි. ශිෂ්ඨ සම්පන්න ලෝකයට තර්ජනයක් වන ත්‍රස්තවාදය මුලිනුපුටා දැමිය යුතුය. කුමනාකාර හෝ ත්‍රස්තවාදී කටයුත්තක් කොහේ කොතැනක සිදු වුවත් එය හෙළා දැකීමේ දැඩි ප්‍රතිපත්තියක් අනුගමනය කරන ශ්‍රී ලංකාව ත්‍රස්තවාදය සම්බන්ධයෙන් වූ තීරණාත්මක ක්‍රියාමාර්ග වලට සහය ලබාදෙයි.

ත්‍රස්තවාදය මැඩලීම සම්බන්ධයෙන්වන සහයෝගීතාව උදෙසා ත්‍රස්තවාදය මැඩපැවැත්වීම පිළිබද වූ සාර්ක් කලාපීය සම්මුතිය, ත්‍රස්තවාදය පිළිබද වූ 2004 අතිරේක සන්ධානය, 2009 පෙබරවාරි 28 වන දිනැති සාර්ක් අමාත්‍යවරුන්ගේ ප්‍රකාශය වැනි නෛතික ලේඛණ අප කලාපය සතුවන අතර හුදෙක් එම ලේඛණ හා ප්‍රකාශන ක්‍රියාත්මකභාවයට පත් කිරීම අත්‍යාවශ්‍යවූවකි.

ගරු කථානායකතුමනි,

මෙම ව්‍යසනය අප කලාපයෙන් අතුගා දැමීමට අපි අධිෂ්ඨානශීලීව එකට එක්විය යුතු කාලය දැන් එළඹ ඇත. කලාපය වෙනුවෙන් අප සතුවන ඉලක්කවලට ළගාවීමේ මග අහුරන ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමට සියලුම දකුණු ආසියානු නායකයින් එකට එක්වී දැඩි තීරණයකට එළඹීමට හා ඒ වෙනුවෙන් ස්ථිර ක්‍රියාමාර්ග ගැනීම කළ යුතුය. දකුණු ආසියානු කලාප වැසියන්ට වඩා හොද ජීවන තත්වයක්, යටිතල පහසුකම්, අධ්‍යාපනය, සාමය සෞබාග්‍ය, ආරක්ෂාව හා මිත්‍රත්වය උරුම කර දීම අතපසු නොකළ යුතුය.

ගරු කථානායකතුමනි,

නොවැම්බර් මස 09 හා 10 යන දිනවලදී ඉස්ලාමාබාද්හි පැවැත්වීමට නියමිතව තිබූ 19 වන සාර්ක් සමුළුව කල් දැමීම සම්බන්ධයෙන් රජය නිකුත් කළ නිවේදනය සම්බන්ධයෙන් විවිධ අය විවිධ අදහස් පළ කොට තිබුණි. ගරු කථානායකතුමනි, රජය කිසිදු හේතුවක් මත 19 වැනි සාර්ක් සමුළුවෙන් ඉවත් වූයේ නැත.

මේ සභාවේ සියලු දෙනා දන්නා පරිදි සාර්ක් ප්‍රඥප්තියේ පොදු විධි විධාන වලට අනුව "සියලුම මට්ටමේ තීරණ ඒකමතිකභාවයෙන් යුක්තවිය යුතුය." එසේ හෙයින් සාර්ක් සමුළුවකට සහභාගීවීම යම් රටක් ප්‍රතික්ෂේප කළ හොත් එම සමුළුව පැවැත්වීමේ හැකියාවක් නොමැත. එම නිසා ශ්‍රී ලංකාව සාර්ක් සමුළුවෙන් ඉවත්වීම එසේත් නැතහොත් එම සමුළුවට සහභාගී නොවන බව ප්‍රකාශ කිරීම ගැටළුවක් නොවන්නේය. සහභාගී වීමට සාර්ක් සමුළුවක් නොමැති බැවිනි. ශ්‍රී ලංකාව තම අභිමතය ප්‍රකාශයට පත් කළේ වත්මන් සාර්ක් සභාපතිත්වය දරණ නේපාලය වෙත අනිකුත් සාමාජික රටවල් කිහිපයක් විසින් ඔවුන් සහභාගී නොවීම පිළිබදව පූර්ව දැනුම්දීම් සිදු කිරීමෙන් පසුවවන අතර පසුව සභාපතිවන නේපාලයද ප්‍රකාශයක් කළේය.

රාජ්‍යන් කිහිපයක් සමුළුවට සහභාගී නොවන බව ප්‍රකාශ කොට තිබීමත් සමග නොවැම්බර් මස 09 හා 10 යන දිනවලදී සාර්ක් සමුළුව පැවැත්වීමට සුදුසු වාතාවරණයක් කලාපය තුළ නොපවතින බවට අපි අපගේ ප්‍රකාශයෙන් කනස්සල්ල ප්‍රකාශ කර සිටි අතර කලාපීය සහයෝගීතාව පවත්වා ගැනීම සදහා යෝග්‍ය

වටපිටාවක් ඇති කර ගැනීමට කලාපය තුළ සාමය හා ආරක්ෂාව තහවුරු කිරීමේ පියවර ගනු ඇතැයි අපි අපේක්ෂා කළෙමු.

ගරු කථානායකතුමනි,

කලාපීය සහයෝගීතාව සඳහා ඇප කැපවී කටයුතු කරන රටක් ලෙස හා ශ්‍රී ලාංකික ජනතාවට පැහැදිලිවම කලාපීය සහයෝගීතාවයේ ප්‍රතිලාභ අත් කර දෙන රටක් ලෙස 19 වැනි සාර්ක් සමුළුව කවදා හෝ පවත්වන විටක ඊට සහභාගීවීමට අපි සැදී පැහැදී සිටින්නෙමු.

ගරු කථානායකතුමනි,

මෙය අතීතය, අතීත අසාර්ථකවීම් අමතක කොට හා අවංකභාවයෙන් යුතුව අප කලාපයේ ජනතාවගේ අති මහත් යහපත තකා ඒකරාශී වී කටයුතු කිරීමට කලාපයේ සියලුම නායකයින් අධිෂ්ඨාන කර ගත යුතු මොහොතක් බව මාගේ උදාර හැඟීමයි.

***